**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය - 2020**

**--------------------------------------------------------------------------------**

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹී අංක 5788 -එල්කේ දරණ ණය ගිවිසුමේ පොදු කොන්දේසිවල ඇතුලත් II බී (3) වගන්තිය සහ 4.09 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තාකල යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වත්කම් කළමනාකරණය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ නිර්මානකරණය, ඉදිකිරීම, නඩත්තුව හා ක්‍රියාත්මකකිරීම යන කරුණු නිසි ක්‍රම වේදයකින් යුතුව භාවිතාකර නිමැවුම් සහ කාර්ය සාධනය පදනම්කරගත් කොන්ත්‍රාත් ක්‍රම භාවිතයෙන් සකසන ලද ආකෘතියක් (OPBRC) යටතේ පැලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) නියමුකරණය කිරීමයි. සංවර්ධන ණය ගිවිසුම් අංක 5788 අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වි.ගැ.හි මිලියන 90.5 කට සමාන එ.ජ.ඩො මිලියන 125 ක් හෙවත් රු.මිලියන 18,125 ක් වූ අතර සම්පූර්ණ වටිනාකම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංමායතනය එකඟවී තිබුණි. කෙසේවෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස්කර තිබුණි. ඒ අනුව, මූලික ණය ප්‍රතිපාදනයෙන් රු. මිලියන 14,500 කට සමාන එ.ජ.ඩො මිලියන 100 ක් ව්‍යාපෘතියෙන් ඉවත්කර, සියළුම පළාත් මාර්ග වැඩිදියුණු කිරිම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයට වෙන්කර දී තිබුණි. ඉතිරි ශේෂයෙන්, ව්‍යාපෘතියේ කටයුතු සිදුකිරීම සඳහා රු. මිලියන 2,320 කට සමාන එ.ජ.ඩො මිලියන 16 ක් වෙන්කර තිබු අතර ඉතිරි මුදල වූ රු.මිලියන 1,232.5 කට සමාන එ.ජ.ඩො මිලියන 8.5 ක් මාර්ග නඩත්තු භාර අරමුදලට මාරුකර තිබුණි. කෙසේවෙතත්, 2020 මැයි 06 දින ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීමකට අනුව කොවිඩ් 19 වැඩපිළිවෙල සඳහා එ.ජ.ඩො මිලියන 7 ක් මාරුකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද මුළු ණය ප්‍රමාණය රු. මිලියන 1,305 කට සමාන එ.ජ.ඩො මිලියන 9 ක් දක්වා නැවතත් අඩු කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජූනි 30 දින ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර තිබුණු අතර 2023 ජූනි 30 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

**----------**

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

| රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 3.2.1 වගන්තිය | ව්‍යාපෘතියේ ආරම්භක මුළු පිරිවැය වූ එ.ජ.ඩො මිලියන 125 2020 ජුනි 30 දින සිට එ.ජ.ඩො මිලියන 9 දක්වා අඩුකර තිබුණද ව්‍යාපෘතියේ සංශෝධිත පිරිවැය අනුව ව්‍යාපෘති කාර්යය මණ්ඩලයේ දීමනා ගලපා නොතිබුණි. එහි ප්‍රත්ඵලයක් ලෙස 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමනාකරණ සේවා චක්‍ර ලේඛයේ 3.2.1 වගන්තියට එරෙහිව එකතුව රු.මිලියන 145,000 ක් ව්‍යාපෘති කාර්යය මණ්ඩලයට ගෙවා තිබුණි. | 01 වැනි වගන්තියේ සඳහන් විස්තර සමග එකගවේ. වැඩ විෂය පථය සහ ව්‍යාපෘති පිරිවැය අඩු කිරීම හේතුවෙන් ව්‍යාපෘති කාර්යය මණ්ඩලයේ වැටුප් හා දීමනා අඩු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ අවශ්‍යතාවයක් දක්වා නොමැත. | කළමනාකරණ සේවා චක්‍රලේඛය සමග අනුකූල වීමට පියවර ගත යුතුය. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය**

| සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන ගැටළු | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|
| | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | | |
| 1. වත්කම් කළමණාකරනය සහාය සහ ඒකකවලට අදාල ධාරිතා වර්ධනය ක්‍රියාත්මක කිරීම. | 13.05 | 8.22 | සංරචකයේ භෞතික ප්‍රගතිය ඉලක්කයෙන් 4.83% කින් පිටුපසින් වේ. | කොවිඩ් 19 වසංගතය සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් |
| 2. මාර්ග ආරක්ෂාව පිළිබඳව ධාරිතා වර්ධනය, පුහුණුව සහ උපදේශනය | 7.76 | 3.20 | සංරචකයේ භෞතික ප්‍රගතිය ඉලක්කයෙන් 4.56% කින් පිටුපසින් වේ. | කොවිඩ් 19 වසංගතය සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | උපකරණ | 3.23 | 1.70 | සංරචකයේ භෞතික ප්‍රගතිය ඉලක්කයෙන් 1.53% කින් පිටුපසින් වේ. | කොවිඩ් 19 වසංගතය සහ කාර්යය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් |

**කළමණාකරනයේ ප්‍රතිචාර** 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 19.77 වන අතර අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 24.05 ක් වේ. 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කයට වඩා සියයට 4.28 කින් පිටුපසින් බව පිළිගනී.

**විගණකගේ නිර්දේශ** ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය.

### 3.2 නිෂ්කාර්ය/භාවිතය නොහොත්/ ඌන උපයෝජිත සම්පත්

| | විගණන ගැටළු | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මුළු කෙරීගෙන යන වැඩ රු.මිලියන 233.35 න්, පැලියගොඩ පුත්තලම මාර්ගයේ හලාවත සිට ජාඇල දක්වා කොටසේ ආරම්භක ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් එකතුව රු.මිලියන 90.57ක් වැය කර තිබුණි. රජය ගනු ලබන තීරණයකට අනුව ඉහත කොටසේ කටයුතු නතර කර තිබුණු අතර එමනිසා එම වියදම නිෂ්කාරය වියදමක් බවට පත්විය. | ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ කැබිනට් පත්‍රිකාව 2018 අගෝස්තු 15 දින අනුමත කර තිබුණු අතර ව්‍යාපෘතියේ විෂය පථය සංශෝධනය විය. TCAMP ව්‍යාපෘතියේ විෂය පථයෙන් පැලියගොඩ පුත්තලම මාර්ගය වැඩිදියුණු කිරීම සහ ඉඩම් සහ ගොඩනැගිලි සඳහා වන්දි ගෙවීම සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත. | පාඩු අවම කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ විශේෂ (ඩොලර්) ගිණුමට රු.මිලියන 236.12 කට සමාන එජඩො මිලියන 1.5ක් ලැබී තිබුණද වර්ෂ 2කට පසුව ව්‍යාපෘතිය සියයට 58.19 ක් නියෝජනය වන රු.මිලියන 137.4 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර විනිමය ලාභය ඇතුළුව ඉතිරි මුදල වූ රු.මිලියන 137.07 ක් වියදම් නොකර විශේෂ (ඩොලර්) ගිණුම පැවතුණි. | 2020 වර්ෂයේ ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්වීම හේතුවෙන් සත්‍ය පිරිවැය රු.මිලියන 137.4ක් විය. (58.19%). එම නිසා විනිමය ලාභය ඇතුළුව රු.මිලියන 137.07 ක ඉතිරි මුදල විශේෂ (ඩොලර්) ගිණුමේ වියදම් නොවී පැවතුණි. | ව්‍යාපෘතියයේ කටයුතු නිසි පරිදි සැලසුම් කල යුතු අතර ණය ගිවිසුම අවසන් වීමට පෙර ඒවා නිම කිරීමට කටයුතු කඩිනම් කල යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළු | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලසුමට අනුව ව්‍යාපෘතිය 2020 වර්ෂය තුලදී ඉහලට ඔසවන යන්ත්‍ර (sky lift), බහුකාර්ය ජාල සමීක්ෂණ රථය | ව්‍යාපෘතිය වත්කම් අත්පත්කර ගැනීම් සඳහා අවශ්‍ය පියවර / උත්සාහයන් ගෙන තිබුණි. | ව්‍යාපෘතියේ ප්‍රමාදවූ කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

| | |
|---|---|
| 2ක් (Network Survey vehicle), මාර්ග මිනුම් යන්ත්‍ර (Road milling machine) මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ශ්‍රී ලංකා රජය විසින් ආනයන සීමා පැනවීම සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාදවීම හේතුවෙන් ව්‍යාපෘතියේ සැලසුම් කල ප්‍රසම්පාදන කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. | කෙසේවෙතත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි. |

**3.4 මානව සම්පත් කළමණාකරනයට අදාල ගැටළු**

| තනතුරු | තනතුරු ගණන | | | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ------------ | ----------------- | | | -------------- | ---------- |
| | **අනුමත** | **2020 දෙසැම්බර් 31 දිනට සත්‍ය** | **පුරප්පාඩු** | ප්‍රසම්පාදන විශේෂඥ ව්‍යාපෘති ඉංජිනේරු සහ GII විශ්ලේෂක තනතුරු සඳහා පුරප්පාඩු 3ක් පවතී. | 2023 මාර්තු 31 දිනට ණය ගිවිසුම අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. එම නිසා අවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට සහ ව්‍යාපෘතියේ වැඩ විෂය පථය නියමිත දිනයන්ට නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| | --------- | ----------- | ---------- | | |
| ප්‍රසම්පාදන විශේෂඥයන් | 01 | - | 01 | | |
| ඉංජිනේරු ps4 | 02 | 01 | 01 | | |
| GII විශ්ලේෂක | 01 | - | 01 | | |